00187

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩසටහන
අවසාන පරීක්ෂණය - 2012

**ESC 2315 -** මුල් ළමාවියේ සංවර්ධනය

කාලය - පැය තුනයි.

---

දිනය - 2013.01.27 වේලාව - පෙ.ව. 09.30- ප.ව. 12.30 දක්වා

---

පළමු කොටසේ <u>සියළුම</u> ප්‍රශ්නවලටද ද දෙවන කොටසින් තෝරාගත් ප්‍රශ්න <u>තුනකට (03)</u> ද පිළිතුරු සපයන්න.

<u>I - වන කොටස</u>

01. (i) ඉගෙනීමේ ක්‍රියාවලිය කෙරෙහි සූදානම වැදගත් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

    (ii) ළමයා ඉගෙනීමට සූදානම් බව පෙන්නුම් කරන නිර්ණායක දෙකක් (02) ලියන්න.

02. ළමයින් තුල කථනය පුහුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය කරුණු පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

03. පුද්ගල සංවර්ධනය කෙරෙහි ජානමය බලපෑම් ඇති වන්නේ කෙසේදැයි උදාහරණ දෙකක් (02) සපයමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

04. (i) ළමයින්ගේ චාලක සංවර්ධනයෙහි ප්‍රධාන පියවර තුනක් (03) ලියා දක්වන්න.
    (ii) මෙම චාලක සංවර්ධනයෙහි පියවරයන් ස්වාධීනව මතු වන්නේ ඇයිදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

05. (i) පෝෂණය හා නිවෙස් පරිසරය අතර ඇති සම්බන්ධය කෙටියෙන් පැහැදිලි කරන්න.
    (ii) ළමයින් තුල සෞඛ්‍ය ගැටළු ඇතිවීම කෙරෙහි බලපාන සාධක දෙකක් (02) ලියා දක්වන්න.

06. "කෙළි සෙල්ලම්" තුලින් ළමුන් තුල සංවර්ධනය කළ හැකි කුසලතා පහක් (05) ලියා දක්වන්න.

07. ළමයින්ගේ චිත්තවේගවල අසමානකම්වලට හේතු විය හැකි සාධක තුනක් (03) ලියා දක්වන්න.

08. මුල් ළමාවියේ ඉගෙනීමේ උපාය මාර්ග පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II - වන කොටස

09. (i) උදාහරණ දෙකක් (02) දක්වමින් 'සමාජීය සංවර්ධනය' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) දෙමාපිය - දරු සම්බන්ධතාව පෙර පාසල් ළමයින් තුල සාමාජීය චර්යා සංවර්ධනය සඳහා දායක වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(iii) පෙර පාසල් ළමයින් තුල සමාජීය චර්යා රටා සංවර්ධනය කිරීම සඳහා, පන්ති කාමරය තුලදී ඔබට යොදා ගත හැකි උපායමාර්ග මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

10. "සංකල්ප සංවර්ධනය මනෝවිද්‍යාත්මක ක්‍රියාවලින් ගණනාවක් මත රඳා පවතී."

(i) සංකල්ප සාධනය රඳා පවතින එවැනි මනෝවිද්‍යාත්මක ක්‍රියාවලින් (03) නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉහත දක්වන ලද ඕනෑම මනෝ විද්‍යාත්මක ක්‍රියාවලියක් උදාහරණයක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) පෙර පාසල් ළමයින් තුල භාෂා සංවර්ධනයේ දී දෙමාපිය හා ගුරු භූමිකාව නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

11. "ළමයින්ගේ නිර්මාණකරණ විභවතාව ප්‍රමාණයෙන් වෙනස් විය හැකි නමුත් සෑම ළමයෙකු සතුවම නිර්මාණකරන විභවතාවයක් පවතී. නිර්මාණකරණය සංවර්ධනය සඳහා ඊට අවස්ථා සලසන උත්තේජනාත්මක පරිසරයක් ලබා දිය යුතු බව අද පිළිගත් කරුණකි."

(i) ළමයින් තුල නිර්මාණකරණයට අනුබලය සැපයෙන තත්ත්වයන් හතරක් (04) ලියා දක්වන්න. (ලකුණු 04)

(ii) ළමයි විවිධ වයස් මට්ටම් වලදී විවිධ අන්දමට සිය නිර්මාණකරණ හැකියා ප්‍රකාශයට පත් කරති. එසේ ළමුන් නිර්මාණකරන හැකියා ප්‍රකාශයට පත් කරන ආකාරයන් උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(iii) පෙර පාසල් ගුරුවරියක් ලෙස ළමයින් තුළ නිර්මාණකරණ හැකියා සංවර්ධනය කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් (02) උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) පෙර පාසල් ළමුන් තුල ප්‍රකට සුවිශේෂී චිත්තවේග චර්යා තුනක් (03) නම් කරන්න. (ලකුණු 03)

(ii) ඔබ සඳහන් කළ චිත්තවේග ඇතිවීම කෙරෙහි නිවෙස්වල පවත්නා විවිධාකාර වාතාවරණයන්ගේ බලපෑම උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 12)

(iii) පෙර පාසල් ළමයින් තුල ධනාත්මක චිත්තවේග සංවර්ධනය උදෙසා පෙර පාසල් ගුරුවරියක මඟ පෙන්විය යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

13. පහත මාතෘකා වලින් දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ඉගෙනීමට ඇති මනෝ විද්‍යාත්මක අවශ්‍යතා
(ii) පෙර පාසල් ළමයින්ගේ බුද්ධිමය සංවර්ධනය
(iii) ළමයින්ගේ වර්ධනය හා සංවර්ධනය

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -

00187

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**ADVANCED CERTIFICATE PROGRAMME IN PRE-SCHOOL EDUCATION**
**FINAL EXAMINATION – 2012**
**ESC 2315 – EARLY CHILDHOOD DEVELOPMENT**

**DURATION : THREE (03) HOURS**

**DATE : 27th January 2013** **TIME : 09.30 a.m. – 12.30 p.m.**

ANSWER ALL QUESTIONS IN PART I AND ANY THREE QUESTION IN PART II.

## PART – I

01. i. Explain briefly the importance of readiness in learning.
    ii. Write two (02) criteria to determine that the child is ready to learn.

02. Briefly explain five (05) essential factors needed for speech training in children.

03. Citing two (02) examples, briefly explain how genetic factors influence on development of an individual.

04. i. Write three (03) major steps in motor development in children.

    ii. Explain briefly, why these steps emerge independently.

05. i. Explain briefly the relationship between nutrition and home environment.

    ii. Write two (02) contributing factors for health problems in children.

06. Write five (05) skills which can be developed in children through 'play'.

07. Write three (03) factors that have an influence on variations in children's emotions.

08. Mention five (05) learning strategies in early childhood.

(8 x 5 = 40 marks)

## PART – II

09. i. Citing two (02) examples briefly explain the term "social development".

(04 marks)

ii. Discuss how mother – child relationship contributes in developing the social behaviours in pre-school children.

(08 marks)

iii. Explain the strategies that you could use to develop social behavioural patterns in pre-school children in the classroom.

(08 marks)

10. "Development of concepts depend upon a variety of psychological processes"

i. Name (03) three such psychological processes related to development of concepts.

(03 marks)

ii. Citing an example, explain any of the psychological processes mentioned above.

(07 marks)

iii. Discuss the role of parents and teachers in language development of pre-school children.

(10 marks)

11. "Every child has potential for creativity even though the degree of creativity they possess is different. It is accepted that a stimulating environment should be provided in order for children to develop their creativity"

i. Write four (04) conditions that foster creativity in children.

(04 marks)

ii. Children at different age levels express their creativity in different ways. Citing examples discuss such ways of expressing creativity by children.

(08 marks)

iii. As a pre-school teacher explain two(02) activities which could be used to develop creativity in children.

(08 marks)

12. i. Name three (03) prominent specific emotional behaviours in pre-school children.

(03 marks)

ii. Citing examples discuss the influence of different types of home atmosphere on development of above mentioned emotional behaviours in pre-school children.

(12 marks)

iii. Explain how a pre-school teacher should guide to bring out positive emotional development in pre-school children.

(05 marks)

13. Write short notes on any two (02) of the following.
   i. The psychological needs for learning.
   ii. Development of intelligence in pre-school children.
   iii. Growth and development in children.

(10x2=20 marks)

- Copyrights reserved -